**රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතිය - 2015**

---

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2010 ජුනි 07 දින එළඹි අංක 2624 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වර්තමානයේ මුදල් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම හා ක්‍රියාත්මක කිරීම කෙරෙහි වගකීම දරයි. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පද්ධතියෙහි ණය ගැනුම්කරුගේ මූල්‍ය අවකාශය හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 5,344.8 කට සමාන එජඩො මිලියන 40.8 ක් වන අතර ඉන් රු.මිලියන 4,034.8 කට සමාන එජඩො මිලියන 30.8 ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘති කාර්යයන් 2010 මැයි 01 දින ආරම්භ කරන ලද අතර 2013 ඔක්තෝබර් 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2017 ඔක්තෝබර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල  දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණ බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2015 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරනලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | |
|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ | 30.80 | 4,034.80 | 1,347.00 | 168.00 | 7.40 | 963.00 |
| ශ්‍රීලංර | 10.00 | 1,310.00 | 187.00 | 8.60 | 1.40 | 179.00 |
| | 40.80 | 5,344.80 | 1,534.00 | 176.60 | 8.80 | 1,142.00 |

ඉහත තොරතුරු අනුව, රු.මිලියන 4,034.80 කට සමාන එජඩො මිලියන 30.80 ක් වූ මුළු වෙන්කිරීමෙන් ව්‍යාපෘති කාර්යයන් ආරම්භ කර වර්ෂ 5 ½ ක් ගතවීමෙන් පසුවත්, ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණේ රු.මිලියන 963.00 කට සමාන එජඩො මිලියන 7.40 ක් පමණකි. එබැවින් වෙන්කිරීම්වලින් එජඩො මිලියන 23.40 ක ඉතිරි ශේෂය ඉතිරි මාස 22 ක කාලපරිච්ඡේදය තුළ ණය වසා දැමීම දක්වා උපයෝජනය කිරීමේ හැකියාව සැකසහිතය. තවද වෙන්කරන ලද අරමුදල් ඌන උපයෝජනය හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට ණය නියෝජිතායතනයට එජඩො 35,649 ක බැඳීම් ගාස්තු ගෙවා තිබූ බව ද නිරීක්ෂණය විය.

### 3.2 භෞතික ප්‍රගතිය

ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය හා ධාරිතා සංවර්ධනය නම් වූ ප්‍රධාන සංරචක දෙකකින් ව්‍යාපෘතියේ කාර්යයන් සමන්විත වේ. 2015 දෙසැම්බර් 31 දිනට එම සංරචකයන්හි භෞතික ප්‍රගතිය පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තොරතුරු පද්ධති යටිතල පහසුකම් සැපයීම, ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය ගනුදෙනුකාර භාවිතය හා ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත්තුව 2013 ඔක්තෝබර් 14 දින විදේශීය සමාගමකට එජඩො මිලියන 17.76 කට පිරිනමා තිබුණු අතර 2015 අප්‍රේල් 23 වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද දේශීය ජාලගත කිරීම (Local Area Network) සවිකිරීම, පවත්නා ගිණුම්කරණ පද්ධතිය ඉහළ නැංවීම හා පද්ධති අවශ්‍යතා පිරිවිතරයන් වේගවත් කිරීම හා වෙනස්කිරීම ආදියේ ප්‍රමාදයන් හේතුවෙන් එහි භෞතික ප්‍රගතිය 2015 දෙසැම්බර් 31 දිනට මන්දගාමීව පැවතුණි. ඊට අමතරව, ගිණුම් සටහන් (Charter of Accounts) වෙනස් කිරීම් හා ගිණුම් සටහන් අවසන් කිරීමෙන් පසුව කිරීමට අපේක්ෂිත පද්ධතියේ සංවර්ධනයන් හේතුවෙන් පද්ධතියේ අවශ්‍ය පිරිවිතරයන් අවසන් කිරිමට රේඛීය අමාත්‍යාංශයේ නිලධාරීන් හා පද්ධති ඒකාබද්ධ කිරීමේ පාර්ශවකරු ලෙස සේවා සැපයුම්කරුට නොහැකි වූ බව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් පැහැදිලි කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ධාරිතා සංවර්ධන සංරචකය යටතේ මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 67 දෙනෙකු සඳහා විදේශීය පුහුණු හා මුදල් අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශ විෂය පථය යටතේ පවතින වෙනත් දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල සාමාජිකයන් 200 දෙනෙකුට දේශීය පුහුණුව ලබා දී තිබූ බවත්, ඒ සඳහා පිළිවෙලින් රු.මිලියන 20.17 කට සමාන එජඩො 142,129 ක් හා රු.මිලියන 13.15 කට සමාන එජඩො 92,677 ක් වැය කර තිබූ බවත් නිරීක්ෂණය විය.

### 3.3 මතභේදයට තුඩුදෙන කරුණු

මූල්‍ය අධ්‍යයන ඇකඩමියේ (Academy of Financial Studies) භෞතික ධාරිතාවයන් වැඩිදියුණු කිරීමේ අරමුණ සඳහා ලී බඩු සහ කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය කිරීමට රු.මිලියන 14.19 ක මුදලක් ව්‍යාපෘතිය විසින් වැය කර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, ව්‍යාපෘතිය විසින් පවත්වන ලද පුහුණු වැඩමුළු සඳහා පහසුකම් සැපයීමට ඇකඩමිය විසින් රු.මිලියන 1.42 ක මුදලක්ද සමාලෝචිත වර්ෂය තුළ අයකර තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ පැහැදිලි කිරීමට අනුව, මූල්‍ය අධ්‍යයන ඇකඩමිය ස්වයං මූල්‍යයන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන අතර ඇකඩමිය විසින් සපයන ලද සේවාවලට ගාස්තු අය කරනු ලැබේ.